# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2453/18 - 2025 සැප්තැම්බර් මස 10 වැනි බදාදා - 2025.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ මැද පත්තුව සුළු කොට්ඨාසයේ දොඹගම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දොඹගම්මන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සම්පාදිත 2020/06/29 දිනැති අ.ග.සි. 23 හි අතිරේක 23 හා පත්‍ර 21 දරන පිඹුරේ කැබලි අංක 506 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 7.9486 ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල :

01. **කැබලි අංක 506**
ඉඩමේ නම: දොඹගම්මන වත්ත; ඉඩමේ විස්තරය : ක්ෂේත්‍ර අංක 14; මුල් හිමිකම් පාන්නා: අගලවත්ත වැවිලි සමාගම; ප්‍රමාණය: හෙක්ටයාර් 7.9486.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 29 වැනි දින පෙ.ව. 10.00 ට නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 ඔක්තෝබර් මස 22 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ජී. ඩබ්. රංජිත් ජයලාල්,
ප්‍රාදේශීය ලේකම්,
නිවිතිගල.

2025 සැප්තැම්බර් මස 05 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

EOG 09 - 0076

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : බී/ඉ/03/01/02/දෙහිගල/අත්පත් 15.
*ඔබේ අංකය* : 4-3/15/2019/VE/374.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර* :

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරගහවෙල බටහිර ග්‍රාම නිලධාරි වසමේ කරගහවෙල ගම පිහිටි මොනරාගල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සහතික කර ඇති කැඩැස්තර සිතියම් අංක 720165 කලාප අංක 05 පත්‍ර අංක 01 හි දැක්වෙන ඉඩම් කැබලි :

**ඉඩමේ මුළු ප්‍රමාණය : හෙක්ටයාර් 1.7879**

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: දෙහිගොල්ලේ පතන; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2586.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: දෙහිගොල්ලේ පතන; හිමිකම් කියන අය : රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.8378.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: දෙහිගොල්ලේ වතුයාය; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා: මඩොල්සිම වැවිලි සමාගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4927.

උපලේඛන අංක 01

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරගහවෙල ග්‍රාම නිලධාරි වසමේ කරගහවෙල ගම පිහිටි මොනරාගල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සහතික කර ඇති කැඩැස්තර සිතියම් අංක 720165 කලාප අංක 07 පත්‍ර අංක 01 හි දැක්වෙන ඉඩම් කැබලි :

**ඉඩමේ මුළු ප්‍රමාණය : හෙක්ටයාර් 2.7856**

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: දෙහිගොල්ලේ වතුයාය; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා: මඩොල්සිම වැවිලි සමාගම; ප්‍රමාණය: හෙක්ටයාර් 2.1932.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: හාවා කෙළිය ගල පතන; හිමිකම් කියන අය : රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5143.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: හාවා කෙළිය ගල පතන; හිමිකම් කියන අය : රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0781.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 නොවැම්බර් මස 10 වැනි දින පෙ.ව. 09.30 ට බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 නොවැම්බර් මස 03 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කේ. එම්. ජී. කපිල බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
බිබිල.

2025 සැප්තැම්බර් මස 03 වැනි දින,
බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

EOG 09 - 0077